# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 773 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/05/2024<br>පැය 1245 |

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සමාජිකයෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව**

සංවිධානාත්මක අපරාධ කල්ලි සමාජිකයෙකු වන අධිකාරම් මුදියන්සේලාගේ රමේෂ් ප්‍රියජනක නොහොත් මන්නා රමේෂ් යන අය ඩුබායි පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් භාරයට ගෙන 2024.05.07 වන අද දින දිවයිනට රැගෙන ඒමෙන් අනතුරුව වැඩිදුර විමර්ශන කටයුතු සඳහා ගුවන් තොටුපොළේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 වන නො. 489/1, යාලගම, නාපාවල, අවිස්සාවේල්ල ලිපිනයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු පහත සඳහන් අපරාධයන් සම්බන්ධයෙන් පොලිසියට අවශ්‍ය කරන පුද්ගලයෙකු බවත් ඇතැම් අපරාධයන් සම්බන්ධව ගරු අධිකරණ වල නඩු විභාගය වෙමින් පවතින බවටත් පෙන්වා දිය හැකිය.

- 2017.03.25 අවිස්සාවේල්ල පොලිස් වසමේ නො 66, නාපාවල, අවිස්සාවේල්ල ලිපිනයේ පදිංචි පුද්ගලයෙකු පැහැරගෙන ගොස් අතින් පයින් පහර දී තුවාල සිදුකිරිම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2017.04.12 දැරණියගල පොලිස් වසමේ පුද්ගලයෙකුට පහර දී තුවාල සිදු කර රුපියල් 6000/- ක් වටිනා ජංගම දුරකථනයක් කොල්ලකෑම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2017.10.09 රත්නපුර පොලිස් වසමේ පුද්ගලයෙකුට පහර දී පැහැරගෙන ගොස් සිරකරගෙන තබාගෙන රුපියල් 1600/- ක් හා දේපල කොල්ලකෑම - රත්නපුර
- 2018.10.29 අවිස්සාවේල්ල පොලිස් වසමේ නො. 19/බි, දිවුරුම්පිටිය, ගැටහැත්ත ලිපිනයේ පදිංචි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් කපා කොටා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - අවිස්සාවේල්ල අධිකරණය.

- 2019.11.16 අවිස්සාවේල්ල පොලිස් වසමේ අංක 685/2, නවගම්මාන, ඇපලපිටිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුගේ නිවසට රාත්‍රී කාලයේ අයුතු ලෙස ඇතුලු වී නිවසේ දොර කඩා දේපල වලට අනර්ථය සිදුකිරීම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2020.12.13 අවිස්සාවේල්ල පොලිස් වසමේ විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක් හා මෙරට නිෂ්පාදිත ගල්කටස් වර්ගයේ ගිනි අවියක්, ටි 56 වර්ගයේ ජීව උණ්ඩ, කඩු 02 ක් සන්තකයේ තබා ගැනීම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2021.12.18 අවිස්සාවේල්ල පොලිස් වසමේ නො 489/1, යාලගම, නාපාවල ප්‍රදේශයේ පුද්ගලයෙකුට රිපීටර් වර්ගයේ ගිණි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2023.05.26 අවිස්සාවේල්ල පොලිස් වසමේ තල්දූව සමන් දේවාලය අසලදී යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් පුද්ගලයෙකුට ගිනි අවියකින් වෙඩි තබා තුවාල සිදුකිරීම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2023.09.20 අවිස්සාවේල්ල පොලිස් වසමේ තල්දූව ගුරුපස්ගොඩ වංගුවේදී ත්‍රිරෝද රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයින් තිදෙනෙකුට ටී56 වර්ගයේ ගිණි අවියකින් වෙඩි තබා මරණයට පත්කර තවත් පුද්ගලයෙකුට බරපතල තුවාල සිදුකිරීම - අවිස්සාවේල්ල අධිකරණය.
- 2023.10.15 ඉහත අධිකරණ කටයුතුවල ප්‍රධාන සාක්ෂිකරුවෙකු වන අවිස්සාවේල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාට සහ ඔහුගේ පවුලේ අය ඝාතනය කරන බවට දුරකථනයෙන් මරණීය තර්ජනය කරමින් සාපරාධී බිය ගැන්වීම - අවිස්සාවේල්ල අධිකරණය.

ඉහත අපරාධ වලට අවශ්‍ය සැකකරුවකු වන මොහු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**